ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

මගේ අංකය / எனது இல. / My No.
ඔබේ අංකය / உமது இல. / Your No.
දිනය / திகதி / Date: 2021 . 11 . 29

පැමිණිලි පාර්ශවය : පී.පී.ආර්.සී.ජ්.ගම්ලත් මයා.
අංක 31. 1 පටුමග.
රණවිරු ගම්මානය අසල.
අලුවිහාරේ.
මාතලේ.

වගඋත්තරකාර පාර්ශවය : 01. පොලිස්පති.
පොලිස් මූලස්ථානය.
කොළඹ 01.

02. අධ්‍යක්‍ෂ ජනරාල්.
වෙළෙඳ තීරුබදු හා ආයෝජන ප්‍රතිපත්ති දෙපර්තමේන්තුව.
මුදල් අමාත්‍යාංශය.
කොළඹ 01.

<u>පැමිණිලි අංක : එච්.ආර්.සී/3794/19</u>

පැමිණිල්ලේ කරුණු දැක්වීම :

පැමිණිලිකරු පොලිස් අධිකාරිවරයෙකු ලෙස සේවය කරමින් සිටියදී වැඩ තහනමකට ලක් කර තිබීම පදනම් කර ගනිමින් තීරුබදු රහිත වාහන බලපත්‍රයක් ලබාගැනීමට ඇති අයිතිවාසිකම වගඋත්තරකරුවන් විසින් අහිමි කර තිබීම මත පැමිණිල්ල ගොනුකර ඇත. වෙළෙඳ තීරුබදු හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව වෙත තීරුබදු රහිත වාහනයක් ආනයනය කර ගැනීමට ඊට අදාල චක්‍රලේඛ ප්‍රකාරව නියමිත දිනට අයදුම් සිදු කළ ද පළමු වගඋත්තරකාර හිටපු පොලිස්පති පූජිත ජයසුන්දර මහතා විසින් තමා සමග තිබූ පුද්ගලික හා දේශපාලන පලිගැනීම් හේතුවෙන් අදාල අයදුම්පත



ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office: 14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ - 04. / 14, ஆர்.ஏ.த. மெல் மாவத்தை, கொழும்பு - 04. / 14, R. A. De Mel Mawatha, Colombo - 04.
දුරකථන / தொலைபேசி / Telephone: 94 -11- 2505580 / 81 / 82
සභාපති / தவிசாளர் / Chairperson: 011-2505451
ලේකම් / செயலாளர் / Secretary: 011-2505521
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2505541 / 74
ක්ෂණික / துரித அழைப்பு / Hotline: 1996
ඊමේල් / மின்னஞ்சல் / e-mail: sechrc@gmail.com
වෙබ් / இணையம் / Web: www.hrcsl.lk

නිවැරදි දිනයන්හිදී 02 වන වගඋත්තරකරු වෙත යොමු නොකර තිබීමෙන් තම අයිතිවාසිකම් අහිමි කළ බව ද වෙනත් අයදුම්කරුවන්ට එකී අවස්ථාව ලබා දී තමාට පමණක් වෙනස්කොට සැලකීමෙන් කටයුතු කර තම මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කළ බවද වගඋත්තරකරුවන් සියළු අභියාචනා නිශ්ප්‍රභාග කර හෝ නොසළකා හරිමින් කටයුතු කර ඇති බවද වැඩිදුරටත් තම පැමිණිල්ලෙන් දක්වා තිබේ.

වගඋත්තරකාර පාර්ශවයේ කරුණු දැක්වීම :

පළමු වගඋත්තරකාර පොලිස් මූලස්ථානය විසින් පැමිණිල්ලට අදාළව ලබාදී ඇති උත්තර වාර්තාවෙන් පහත කරුණු අනාවරණය කර තිබේ.

පැමිණිලිකරු විසින් වෙළෙඳ තිරුබදු ආයෝජන ප්‍රතිපත්ති චක්‍රලේඛ 01/2016 යටතේ සහනදායී මෝටර් රථ ආනයන බලපත්‍රයක් ලබා ගැනීම සඳහා අයදුම්පත්‍රයක් පළමු වරට 2016.07.18 දින ඉදිරිපත් කර ඇත.

නිලධාරියෙකුට එරෙහිව විනය පරීක්ෂණයක් පවතින්නේ නම් එම බලපත්‍රය නිකුත් නොකිරීමට චක්‍රලේඛීය ප්‍රතිපාදන තිබේ. මෙම පැමිණිලිකාර නිලධාරියා සම්බන්ධවද එම විමසීම් සිදු කර ඇති අතර SIU/64//2016 යටතේ මූලික විමර්ශනයක් සිදු කරමින් පවතින බව විශේෂ විමර්ශන අංශයේ අධ්‍යක්ෂ විසින් දන්වා තිබීම මත මෙම බලපත්‍රය නිකුත් කිරීම අත්හිටුවා තිබී ඇති බව දක්වා ඇත.

පසුව නිලධාරියා විසින් පොලිස්පති සහන මැදිරියට කළ අභියාචනා අනුව මූලික විමර්ශන ආරම්භ කර ඇත්තේ 2016.09.27 දින සිට කළ දැන්වීම පරිදි බැවින් ද වාහන බලපත්‍රයට අයදුම්කර ඇත්තේ 2016.05.09 දිනට ඇති වසර 06ක සම්පූර්ණ කළ සේවා කාලය පදනම් කරගෙන බැවින් ද එම වසර 06ට අදාළ කාලය සහ බලපත්‍රයට අයදුම් කළ දින දක්වා එවැනි මූලික පරීක්ෂණයක් නොතිබූ බැවින් වාහන ආනයනයට බලපත්‍ර ලබාදීම නිර්දේශ කළ බවය.

එහෙත් 2017.06.02 දින පූර්වගාමී පොලිස්පති ලෙස සේවය කළ පූජිත ජයසුන්දර මහතා වෙත ලිපි ගොනුව අදාළ අත්සන යෙදීම සඳහා ඉදිරිපත් කළද ඔහු විසින් විමර්ශන කටයුතු අවසන් වන තුරු වාහන ආනයන බලපත්‍ර අයදුම්පතට අදාළ නිර්දේශයට අත්සන් කළ නොහැකි බව දන්වා ඇත.

2018.06.14 දින ද පැමිණිලිකරු අභියාචනයක් නිකුත් කර තම ඉල්ලීම ඉටුකර දෙන ලෙස ආයාචනා කර තිබූ බව ද දක්වා තිබේ. ඒ අනුව ආරක්ෂක අමාත්‍යාංශය වෙත අධ්‍යක්ෂ (සිවිල් පරිපාලන) විසින් මෙම පැමිණිලිකරුට වාහන බලපත්‍රය ලබාදීමට ඇති සුදුසුකම් සලකා බලා 01/2018(1) දරණ වෙළඳ තිරුබදු හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තු චක්‍රලේඛය යටතේ අදාළ සහනය ලබාදීමට නිර්දේශය යවා තිබී ඇත.

ආරක්ෂක අමාත්‍යාංශය ඒ අනුව තම අංක 01/22/05/02 (2019-110) හා 2020.07.06 දින වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව වෙතින් විමසීමක් සිදු කර ඇත.

වෙළෙඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක TIP/SS01/79 හා 2020.07.22 දිනැති ලිපිය මගින් 01/2016 දරණ ඊට අදාලව එම දෙපාර්තමේන්තුවේ පැවති චක්‍රලේඛය යටතේ ඇති බලපත්‍රයට අදාළ හිමිකමක් අහිමිවීම 01/2018 චක්‍රලේඛය යටතේ ආවරණය කර නොමැති බැවින් අදාළ සහනය ලබාදිය නොහැකි බව දක්වා ඇති බව පෙන්වා දී තිබේ.

මේ පිළිබඳ 02 වන වගඋත්තරකරුගේ උත්තර ප්‍රකාශය පහත පරිදි වේ. පැමිණිලිකරුට සහනදායී මෝටර් රථ බලපත්‍රයක් නිකුත් කිරීමට අදාලව 2019.11.22 දිනැති ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්ගේ අංක 01/2205/02 (2019-110) දරණ ලිපි වලට අනුව දෙන ලද පිළිතුරු ලෙස තම උත්තරවාද දක්වා තිබේ.

පැමිණිලිකරු 2016.07.28 දින වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති චක්‍රලේඛ අංක 01/2016 හි විධිවිධාන යටතේ පොලිස් දෙපාර්තමේන්තුව වෙත අයදුම්පත යොමු කළද 2016.09.27 දින පැමිණිලිකරුට එරෙහිව මූලික විමර්ශන ආරම්භ කරන තුරු අදාළ අයදුම්පත පොලිස් දෙපාර්තමේන්තුව හෝ රේඛීය අමාත්‍යාංශය වන ආරක්ෂක අමාත්‍යාංශය කටයුතු කර තිබී නැති බව දක්වා තිබේ.

මූලික පරීක්ෂණ ආරම්භ කරන බව 2016.09.27 පැමිණිලිකරුට දක්වා ඇති අතර මූලික පරීක්ෂණ අවසන් වනතුරු අදාළ බලපත්‍ර සහනය ලබා නොදීම චක්‍රලේඛයට අනුව පවතින නීතිමය තත්ත්වය වේ. 2019.05.10 දින සිට පැමිණිලිකරුගේ වැඩ තහනම් කිරීමද පසුව සිදුව ඇති බව වාර්තාවෙන් පෙන්වා ඇත. 01/2018 දරණ චක්‍රලේඛය වාහන බලපත්‍ර සහනදායී ක්‍රමයට ලබාදීමට වර්තමානයේ ක්‍රියාත්මක වන චක්‍රලේඛය බැවින් එහි 2.5 වගන්තිය අනුව මූලික පරීක්ෂණයක් හෝ විධිමත් විනය පරීක්ෂණයක් ආරම්භ කර ඇති නිලධාරියෙකු හට එකී කටයුතු අවසන් වනතුරු එම බලපත්‍ර සහනය නීතිමය වශයෙන්ම අහිමි බව දක්වා තිබේ. එමෙන්ම 01/2016 චක්‍රලේඛය ක්‍රියාත්මකව පැවති කාලයේ හිමි වරප්‍රසාදයක් අහිමිව තිබේනම් එය ලබාදියයුතු බවද 01/2018 චක්‍රලේඛයේ නීතිමය කාරණාවක් ලෙස නොතිබීම මත පැමිණිලිකරුට අදාළ සහනය ලබාදීම ප්‍රතික්ෂේප කර තිබෙන බව වාර්තාව අනුව පැහැදිලි වේ.

**පරීක්ෂණයේදී අනාවරණය කරගත් කරුණු :**

පැමිණිලිකරු තම පැමිණිල්ලට අදාළ කරුණු වැඩිදුරටත් තහවුරු කරමින් වැඩිදුරටත් කරුණු දක්වා සිටි අතර වගඋත්තර කරුවන් වැඩිදුරටත් මෙතෙක් තම වාර්තා තුළින් පැමිණිල්ලට අදාලව ලබාදී ඇති කරුණුම තහවුරු කරන ලදි. හිටපු පොලිස්පති පූජිත ජයසුන්දර මහතා තමා සමග ඇති කරගත් පුද්ගලික අමනාපයක් ද්වේශ සහගත පළිගැනීමක් දක්වා වර්ධනය වීම තම බලපත්‍රය අහිමි කිරීමට හේතු වූ බව පැමිණිලිකරු දක්වා සිටින ලදි.

පැමිණිලිකරු දේශපාලන පළිගැනීම් පිළිබඳ කරුණු සොයා බැලීමේ කොමිෂන් සභාවට තම පැමිණිල්ල ඉදිරිපත් කළ පසු එය විභාග කර පැමිණිලිකරුගේ වැඩ තහනම ඉවත් කර සේවයේ පිහිටුවා සහනදායී බලපත්‍රය ලබාගැනීමට ඇති අයිතිය යළි නිර්දේශ කර එම තීරණය ක්‍රියාත්මක කිරීමට කැබිනට් අනුමැතියට ඉදිරිපත් කර ඇති බව අදාළ ලේඛන මගින් තහවුරු කරන ලදි.

පොලිස් දෙපාර්තමේන්තුව විසින් පැමිණිලිකරුගේ ඉල්ලුම් පත්‍රය නිර්දේශ කර තිබූ බවට අදාළ වාර්තාව මගින් තහවුරු කළ කරුණු කියා සිටින ලදී.

වෙළෙඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව විසින් කියා සිටින්නේ යම් විමසීමක් කරන්නේ නම් පිළිතුරු ලබා දෙන බවත් ලිඛිතව තම කරුණු මීත් පෙර ලබාදී ඇති බවත් ය.

ඒ අනුව පැමිණිලිකරු අසා සිටින්නේ හිටපු පොලිස්පති පූජිත ජයසුන්දර මහතා අනිවාර්ය විශ්‍රාම ගන්වා ඇත්තේ විනය පරීක්ෂණයකට යටත්ව බැවින් ඔහුට බලපත්‍ර සහනය ලබා දී තමාට පමණක් එම බලපත්‍ර සහනය අහිමි කිරීමට හේතුව කුමක්ද යන්නය. එයට වගඋත්තරකරු පිළිතුරු ලබාදී නැති අතර පෙත්සම්කරු විමසා සිටින්නේ තම බලපත්‍රය අහිමි කර තිබීම සම්බන්ධව් කළ අභියාචනාව ඊට අදාළව කරුණු විමසා බලන ලද විශේෂ කමිටුවට යොමු කළද තමාට ඊට ඉදිරිපත්වීමට කිසි දිනක අවස්ථාවක් ලබා නොදුන්නේ කුමන හේතූන් මතද යන්නය. වෙළෙඳ හා තීරුබදු ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ පිළිතුර වන්නේ ඊට අදාළ ලිපි ගොනුව කමිටුවට යොමු කිරීම පමණක් සිදු කළ බවද මීත් පෙර එවැනි අභියාචක අවස්ථාවලදී ද අභියාචනා ගොනුව පමණක් එම විශේෂ කමිටුව සලකා බැලීම පමණක් සිදුවූ බවය.

2016 වසරේ හිමිවියයුතු තීරුබදු සහන බලපත්‍රය තමාට අහිමි වුවහොත් විශ්‍රාම ගැනීමට පෙර හිමි වියයුතු දෙවන බලපත්‍ර සහනය ද තම සේවයට අදාළ වරප්‍රසාදයක් වුවද එම දෙවන සහනය අහිමි වීමට ද මෙම කරුණු බලපාන බව පැමිණිලිකරු වැඩිදුරටත් පරීක්ෂණ දින දක්වා සිටින ලදී.

**නිරීක්ෂණ හා නිගමන :**

පැමිණිලිකරු තංගල්ල පොලිස් අධිකාරී දිස්ත්‍රික් 1 භාර නිලධාරී ලෙස සිටියදී 2019.05.10 දින වැඩ තහනමකට ලක්ව ඇති බවද 2016.05.10 දිනය වනවිට තීරුබදු රහිත වාහන ආනයනය බලපත්‍රයක් ලබාගැනීමට සුදුසුකම් සම්පූර්ණ කර තිබී ඇතත් හිටපු පොලිස්පති පූජිත ජයසුන්දර මහතා විසින් ඇති කරගත් පුද්ගලික හා ද්වේශ සහගත පළිගැනීම් හේතුවෙන් වාහන බලපත්‍රය ලබාගැනීමට ඇති අයදුම්පතට අදාළ නිර්දේශයට අත්සන් තබා එය 02 වන වගඋත්තරකාර වෙළෙඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව වෙත යවා තිබී නොමැති බව නිරීක්ෂණය වේ.

2015 ජනවාරි 08 වන දින සිට 2019 නොවැම්බර් මස 16 වන දින දක්වා වූ කාලය තුළ රජයේ නිලධරයින්ට සිදුව ඇතැයි කියනු ලබන දේශපාලන පළිගැනීම් පිළිබඳ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවේ තීරණය වී ඇත්තේ ද කොළඹ මහාධිකරණයේ ඇති පෙත්සම්කරුට එරෙහි නඩුවෙන් අධි චෝදනා පත්‍රය ඉවත් කර පැමිණිලිකරු නිදොස් කොට නිදහස් කර වැඩ තහනම ඉවත් කර නැවත සේවයේ පිහිටුවා සහනදායී පදනම මත හිමිවියයුතුව තිබූ වාහන බලපත්‍රය ලබාදිය යුතු බවය.

අල්ලස් පිළිබඳ පැමිණිලි වලට අදාළව පරීක්ෂණ පැවැත්වීම සම්බන්ධව පොලිස්පති චක්‍රලේඛ: 1623/2002 අනුව දක්වා ඇත්තේ. හැකි සෑමවිටම එම පැමිණිලි ප්‍රකාශ සටහන් කිරීමකින් තොරව තොරතුරු වශයෙන් පමණක් අල්ලස් දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල් වෙත යොමු කරන ලෙස යි.

එහෙත් මෙම පැමිණිලිකරුට එරෙහිව මූලික පරීක්ෂණ සහ ප්‍රකාශ සටහන් කර ගැනීමෙන් එකී පොලිස්පති චක්‍රලේඛයට පටහැනිව සහ අල්ලස් සහ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ නියමයන්ට පටහැනිව හිටපු පොලිස්පති පූජිත ජයසුන්දර මහතාගේ මෙහෙයවීමෙන් කටයුතු සිදුව තිබීම මෙම පැමිණිලිකරුගේ මූලික අයිතිවාසිකම් කඩවීමට හේතු වී ඇති බව සනාථ කෙරේ.

2016.07.28 දින නිරුබද්‍ර රහිත වාහන බලපත්‍රය ලබාගැනීමට යොමු කළ අයදුම්පතට අනුව සළකා බැලීමේදී එම දින වනවිට පැමිණිලිකරුට එරෙහි කිසිදු මූලික පරීක්ෂණයක් හෝ විනය පරීක්ෂණයක් තිබී නැතත් එම අයදුම්පත නිර්දේශ කිරීම 01 වගඋත්තරකාර ධූරයේ එවකට කටයුතු කළ හිටපු පොලිස්පති. පූජිත ජයසුන්දර මහතා විසින් හිතාමතාම පැහැරහැර ඇති බව නිරීක්ෂණය වේ. පොලිස් මූලස්ථානයේ අධ්‍යක්ෂ (සිවිල් හා පරිපාලන) විසින් ද පැමිණිලිකරු අදාළ බලපත්‍රය ලබාගැනීම සඳහා ඇති හිමිකම තහවුරු කළද වෙනත් නිලධාරීන්ගේ ඊට අදාළ බලපත්‍ර අයදුම්පත් අත්සන් කළද පැමිණිලිකරුගේ අයදුම්පතට අදාළ පොලිස් දෙපාර්තමේන්තුවේ නිර්දේශයට හිටපු පොලිස්පති අත්සන නොලැබීමෙන් පැමිණිලිකරු "නීතිය ඉදිරියේ ඇති සමානාත්මතාවයේ අයිතිවාසිකමද නීතිය ක්‍රියාත්මක කිරීම සර්ව සාධාරණව විය යුතුය" යන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ III වන පරිච්ඡේදයේ මූලික අයිතිවාසිකම් යටතේ වූ 12(1) ව්‍යවස්ථාව උල්ලංඝනය වීමකට ලක් කිරීමට හේතු වී තිබේ.

තවද 02 වන වගඋත්තරකාර වෙළෙඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව වෙත පැමිණිලිකරු කළ ඉල්ලීම් හා අභියාචනා ප්‍රතික්ෂේප කර ඇත්තේ ද යුක්ති සහගතව සළකා බැලීමකින් තොරව ය. 01/2018 චක්‍රලේඛය ප්‍රකාරව 2016 වසරේ දී පැමිණිලිකරු සහන ඉල්ලා තිබී නැත. 2016 වසරේදී 01/2018 චක්‍රලේඛය නිකුත් වී ද තිබී නැති බව පෙන්වා දිය යුතු ය. විශේෂ අභියාචනා පරීක්ෂා කිරීමේ කමිටුව පැමිණිලිකරුට අවස්ථාවක් ලබා නොදී ගොනු පිළිබඳ බලා තීරණ ගැනීම වෙනත් කිසිදු විනය පරීක්ෂණයක් මූලික පරීක්ෂණයක් නොතිබියදී 2016.07.28 දිනැතිව පැමිණිලිකරු තම අයදුම්පත ඉදිරිපත් කර ඇත්තේ විධායක මට්ටමේ තනතුරට අදාළ කාලය පූර්ණ කර සියළු සුදුසුකම් සපුරා තිබියදී ය. එය අමාත්‍යාංශයේ හා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලැබී තිබුණේ නම් හිමි වීමද වැළැක්විය නොහැකි බව අවබෝධ කරගත යුතු වේ. එසේම එය දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ ද්වේශ සහගත පළිගැනීම මත සිදුව ඇති බවද 01/2018 චක්‍රලේඛයට අදාළව නොව 01/2016 චක්‍රලේඛයට අදාළව සළකා බැලිය යුතුව තිබූ එකක් බව අභියාචනා පරීක්ෂණ කමිටුව යුක්ති සහගතව බලා තිබුණේ නම් පෙනී යා යුතු ය. එය ජනාධිපති විශේෂ පරීක්ෂණ කොමිෂන් සභාවට පෙනී යාමෙන් පැහැදිලි වන්නේ 02 වන වගඋත්තරකාර දෙපාර්තමේන්තුවේ විශේෂ කමිටුවද පැමිණිලිකරුගේ අභියාචනාව ස්වභාවික යුක්තියේ මූලධර්ම වලට පටහැනිව සළකා බලා ඇති බවය.

ඒ අනුව 02 වන වගඋත්තකරකරුගේ ක්‍රියා කලාපයෙන් ද පැමිණිලිකරුගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වන අතර එය 1978 තව ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) උල්ලංඝනය කිරීමක් ලෙස නිරීක්ෂණය වන බව නිගමනය කරනු ලැබේ.

තිර්දේශය :

වගඋත්තරකරුවන් විසින් පහත සඳහන් නිර්දේශයන් ක්‍රියාත්මක කිරීමට කටයුතු කළයුතුය.

1. 01/2016 දරණ වෙළෙඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තු පැමිණිලිකරුට චක්‍රලේඛය ප්‍රකාරව හිමිවියයුතු තීරුබදු සහන බලපත්‍ර ලබාදීමට පියවර ගතයුතු අතර 2016 වසරේදී වාහන බලපත්‍ර සඳහා අයදුම් කළ අයදුම්කරුවන් වෙනුවෙන් සළකා බලන ලද නියමන් සහ කොන්දේසි යටතේ සළකා බලා ලබාදීමට කටයුතු කළයුතු ය.

2. 2016 වසරේදී හිමිවියයුතුව තිබූ බලපත්‍රය පැමිණිලිකරු ඊට අදාළ සුදුසුකම් ලබන දිනට ලබාදීමට කටයුතු කළයුතු බවට ද .

3. 2016 වසරෙන් අනතුරුව තවදුරටත් පැමිණිලිකරුට නියමිත තවත් බලපත්‍රයක් ලබාගැනීම සඳහා සුදුසුකම් සපුරාලන්නේ නම් නියමිත දිනයට එකී බලපත්‍රය ලබාදීමට ද පියවර ගතයුතු ය.

2021 12.31 වන දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාව වෙත ලැබීමට සළස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව පනතේ 15 වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත මින් නිර්දේශ කරනු ලැබේ.

එසේම එකී නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින් ද ඉහත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාවට දැනුම් දියයුතු වන අතර. එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සළකා නොබලන බව ද වැඩිදුරටත් දන්වමු.

A. Shanmuganath

අනුසුයා ෂන්මුගනාදන්.
කොමසාරිස්.
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

ම.හේ.නිමල් කරුණාසිරි.
කොමසාරිස්.
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

දි/- Sgd/-

Ms. Anusuya Shanmuganathan
Commissioner
Human Rights Commissioner of Sri Lanka

Dr. M.H. Nimal Karunasiri
Commissioner
Human Rights Commission of Sri Lanka